# Living the Lotus



2
2021
VOL. 185

*Buddhism in Everyday Life*

## *Founder's Reflections*

### බලාපොරොත්තුවේ හදවත

මම කුඩා කාලයේ සිටම, මිනිසුන්ගේ කරදරයකදී නිහඬව බලාසිටීමේ ස්වභාවයක් නොතිබුනි.

සීයාගේ හා තාත්තාගේ ජීවන රටාවෙන්, ස්වභාවයෙන්ම එය මගේ ශරීරයට බද්ධ වුනා යැයි සිතමි. තරුණ වයසට පත්වන විට, දකින හා අසන සෑම දෙයක්ම අන්‍යයන්ට පිහිට වීමට ප්‍රයෝජනවත් වේ යනුවෙන් සිතා මගේ දෙයක් බවට පත්කර ගැනීමට සිතෙයි. ඒ ආකාරයට කටයුතු කිරීම නිසා සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හා හමුවිය.

සූත්‍ර පොතෙහි, 'දකින සෑම දෙයක්ම, අසන සෑම දෙයක්ම, දැනෙන සෑම දෙයක්ම, අවබෝධ වන සෑම දෙයක්ම අපව සත්‍යාවබෝධය වෙතට ගෙනයයි' යනුවෙන් සඳහන් වේ.

දකින හා අසන දේවල් ගැන අරමුණක් නොමැතිව බලා නොසිට, පැහැදිලි ඉලක්කයක් තබාගෙන එදිනෙදා ජීවත්විය යුතුය. හදවතින්ම බලාපොරොත්තු විය යුතුය. එවිට තමාට අවශ්‍ය පිලිතුර, කියවන පොතක් තුල හෝ හමුවන පුද්ගලයෙකුගේ වදනක් තුල මෙන්ම, ඇතිවන සෑම සිදුවීමකින්ම සොයා ගැනීමට හැකිවේ.

එය උදාහරණක් ලෙස කාන්දමක් වැලියට සඟවා තිබුණද, එම වැලිකැට පවා කාන්දමේ ග්‍රහණයට නතුවනවා වාගේය. එසේ නොමැතිව කිසිම බලාපොරොත්තුවක් නැතිව ජීවත්වන පුද්ගලයන් නිධානයක් ඇතුලේ තැබුවත් කිසිවක් තම ශරිරයට බද්ධ කර නොගනී.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 22-23

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.


**Living the Lotus**
**Vol. 185 (February 2021)**

Senior Editor: Keiichi Akagawa
Editor: Kensuke Osada
Copy Editors: P.A.D. Somapala,
Ruklanthi Palipana, Sahan Chamara

*Living the Lotus* is published monthly
by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international
@kosei-kai.or.jp


Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙදා දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙදා ජිවීතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මඟින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙදා දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.



# President’s Message

## අන්‍යයන්ට සතුට ගෙනදෙන පුද්ගලයෙකු බවට පත්වෙමු


නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය


### ‘දිව්‍යමය බලය’ යනු කුමක්ද?

මිනිස් දැනුම ඉක්මවා යන පුදුමාකාර වූ ශක්තිය හඳුන්වන්නේ, ‘සෘද්ධි බලය’ හෝ ‘දිව්‍යමය බලය’ කියාය. එසේම, එම ශක්තිය ‘තම ශරීරයට බද්ධ කරගත නොහැකි විශේෂ වූ ශක්තියක්’ ලෙසයි අප සිතන්නේ.

නිසැකවම එසේ සිතීම පුදුමයක් නොවේ. මන්ද, නොයෙකුත් සූත්‍ර වල පවා දිව්‍යමය බලය සේ සඳහන් වන්නේ, ‘මේ විශ්වයේ සෑම දෙයක්ම දැකිය හැකි’ හෝ ‘මුළු ශරීරයෙන්ම ආලෝකය විහිදුවා ලෝකයම එකාලෝකමත් කිරීම’ ආදී ගුප්ත දේවල් ගැන නිසාය. නමුත්, අපිට කිරීමට නොහැකි කිසිම දෙයක් බුදුන් වහන්සේ විසින් දේශනා නොකරන බව සිතමි. එසේ නම්, මෙම සූත්‍ර වල සඳහන් දිව්‍යමය බලය හෝ සෘද්ධි බලයේ අරුථ කුමක්ද.

මගේ අවබෝධයට අනුව නම්, ‘මනස’ මනුෂ්‍යයන්ට තිබෙන විශිෂ්ටම සෘද්ධි බලයයි. තවත් අයුරකින් පවසනවා නම්, මිනිස් ‘මනසේ’ ශක්තිය හා ක්‍රියාකරිත්වය සෘද්ධි බලය වන බවයි. අපට මනසක් තිබෙන නිසා, අන්‍යයන්ගේ හැඟීම් තේරුම් ගැනීමට හැකිවේ. මිනිසුන් බලාපොරොත්තු වන්නේ මොනවාද යැයි අවබෝධ කර ගැනීමට හැකිවේ. එසේම, බුදුන් වහන්සේ දේශනා කල ධර්මය පවා තේරුම් ගැනීමට හැකියාව ලැබී තිබෙන්නේ මනසක් තිබෙන නිසාය.

නිර්මාතෘ තුමාද ‘ධර්මයේ නියම ඥානය ලබා ගන්නේ නම්, එයද සෘද්ධි බලය ලබා ගත්තා හා සමානය’ ලෙසින් ප්‍රකාශ කර ඇත. එමනිසා සෘද්ධි බලය යනු අසාමාන්‍ය විශේෂ ශක්තියක් යැයි පවසනවාට වඩා, එදිනෙදා ජීවිතයේදී අන්‍යයන් ගැන සිතමින් කටයුතු කිරීමේ හදවත තුලින් සෘද්ධි බලය මෙන් වූ ශක්තිය ගොඩනගා ගැනීමට හැකිවේ. උදාහරණයක් ලෙස, අප සංවිධානයේ සිටින විශාල පිරිසක්, දහම ගැන හොඳ අවබෝධයක් ඇති යහළු මිත්‍රයන්ගේ පිහිටෙන් ‘දුක් කරදර තිබුනත්, ජීවිතයේ නව පණක් ලැබීමට හැකිවුනා’ සේ පවසයි. විටෙක පුදුම සහගත ප්‍රථිපල ලැබෙන සිදුවීම් හා හදවතේ නොයෙකුත් වෙනස්කම් ඇතිවන්නේද, අපගේ මනස ඕනෑම දෙයක් කලහැකි සියළු හැකියාවන්ගෙන් පරිපූර්ණ වී තිබෙන නිසාය.

එහි සාක්ෂියක් ලෙසින්, බුදුන් වහන්සේගේ මග පෙන්වීම මත බුද්ධ ශ්‍රාවකයෙකු බවට පත්වූ අංගුලිමාලව හැඳින්විය හැකිය. එමනිසා ‘සෘද්ධි බලය’ යනු අන්‍යයන් ගැන සිතන හැඟීම වාගේම, එම හැඟීමෙන් නිපදවන ශක්තිය ලෙසින්ද හැඳින්විය හැකිය.



# President's Message

## අන්‍යයන්ව සතුටට පත් කිරීමට හැකිවීමද, සතුටකි

මේ ආකාරයට 'සෘද්ධි බලය' ගැන සඳහන් කල විට, 'කෝසෙයි කායි එකේ නම් සෘද්ධි බලයෙන් යුතු විශාල පිරිසක් සිටිනවා නේ' යනුවෙන් පැවසූ පුද්ගලයෙක් සිටියා, එය සත්‍යයක් යැයි මමද සිතමි. මන්ද, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ තථාගතයන් වහන්සේගේ සෘද්ධි බලය යන 21 වන පරිච්ඡේදයේදී, සෘද්ධි බලය තිබෙන්නේ අන්‍යයන්ව සතුටට පත් කිරීමටයි යනුවෙන් ඇත. 'මහා රිද්දි බලය ලබමින්, අනාවරණය කරනුයේ සිතමින්, සිත් සතුට වෙනුවෙනි මිනිසුන්' සේ සඳහන් නිසා, අන්‍යයන් දිප්තිමත්, කාරුණික හා උණුසුම් පුද්ගලයන් බවට පත්වන ආකාරයට ඔවුන් සමඟ කටයුතු කිරීම වැදගත් වේ. එසේම, අන්‍යයන් ගැන නිතරම සැලකිලිමත් වෙමින්, ඔවුන් ගැන සිතා බලන පුහුණුවේ යෙදෙමින්, ඔවුන්ව සතුටට පත් කරනවා නම් එයද තම සෘද්ධි බලය හැර වෙන කිසිවක් නොවේ.

එසේම, ජපානයේ ප්‍රසිද්ධ අන්පන්මන් නැමැති කාටූනය රචිත තකෂි යනසේ මහතා විසින්, 'මම වඩාත්ම සතුටට පත් වන්නේ, අන්‍යයන්ව සතුටු කිරීමෙනි' යනුවෙනු (PHP ආයතනය විසින් ප්‍රකාශයට පත්කල) 'මෝ හිතොත්සු නෝ අන්පන්මන්' කෘතියේ සඳහන් කර ඇත. තවද, මනුෂ්‍යයන් ලෙස තවත් මනුෂ්‍යයෙකුව සතුටු කිරීම විශාල සතුටක්, ජීවිතයේ ඉහලම සතුට අන්‍යයන්ව සතුටු කිරීම නිසා, කාටූන් ශිල්පියෙකු බවට පත්ව 'උපරිමයෙන් අන්‍යයන්ව සතුටට පත් කිරීමට වුවමනා වුනා' සේ ලියා තිබුනා. මම එය කියවූ විට, 'මේ පුද්ගලයා නම් කාටූන් ශිල්පියෙකු ලෙසින් අන්‍යයන්ව සතුටු කරන බෝධිසත්වයෙකි' සේ දැනුනා වගේම, අන්‍යයන් සතුටට පත්කරන ආකාරයේ ජීවිතයක් ගත කරන්නේ නම්, ඕනෑම කෙනෙකුට තමා සිටිනා ස්ථානයේදීම බෝධිසත්වයෙකු ලෙසින් පත්විය හැකි බවට කියාදෙන බවද හැඟුනා.

එපමණක් නොව, ඔත්පළව ඇඳට වී සිටින කෙනෙකුට වුවද, නිතරම සිනහා මුසු මුහුණින් සිටිමින් හා කෘතවේදී වදන් පවසමින් අන්‍යයන්ව සතුටට පත්කිරීමට හැකිය. එයද විශාල සෘද්ධි බලයක් වනවා සේම, බෝධිසත්ව ක්‍රියවලියකි.

එසේම තම මුළු ශරීරයම භාවිතා කරමින් ධර්මය දේශනා කරන පුද්ගලයන්, 'මෙහෙයවා අපමණ බෝසත් වරුන්, අවසන් කරනු ඇත එකම යානයේ ගමන්' සේ 'තථාගතයන් වහන්සේගේ සෘද්ධි බලය' පරිච්ඡේදයේ සඳහන් කර ඇත. ඒ ආකාරයට අපි එකිනෙකා, සැමට සමගියෙන් වාසය කිරීමට හැකි සාමකාමී ලොවක් බිහිකරමු. එමෙන්ම, නිතරම මුළු හදවතින්ම අන්‍යයන්ව සතුටට පත්කිරීම, තම සතුට ලෙස භාර ගන්නා සාමාජිකයන් විශාල පිරිසකගෙන් අප සංවිධානය පිරී යනු ඇතැයිද බලාපොරොත්තු වෙමි.

From Kosei, February 2021.

# බෝධිසත්ව චර්යයාව යනු දුකින් මිදීමේ මාර්ගයයි

අන්තර්ජාතික මූලස්ථානයේ සභාපති
අකගවා කෙයිඉචි මහතා

මෙම සෙප්පෝව, 2020 වර්ෂයේ 12 වන මස 15 වන දින ගොමෙයිනිචි දිනයේදී දයිසේදෝවේදී පවත්වන ලද්දකි.

සියළු දෙනාගෙන්ම අවසරයි. මම 1960 වර්ෂයේ අකිතා ප්‍රාන්තයේ යොකොතෙ ප්‍රදේශයේ සහෝදරියන් දෙදෙනෙකුගෙන් යුත් අකගවා පවුලේ උපත ලැබුවා. මම කෝසෙයි කායි සංවිධානයේ තුනවන පරම්පරාවේය. සියළු දෙනාගේම අශිර්වාදයෙන් මේ වසරේ මම 60 වන වසරට පා තබනු ලැබුවා. ජීවිතයේ එක් සංධිස්ථානයක් වන මේ කාලයේ සෙප්පෝවක් ඉදිරිපත් කිරීමට ලැබීම ගැන 'ධර්මයට ලැදි පවුලක ඉපිද, කෝසෙයි කායි සංවිධානයේ ආභාෂය සමග හැදී වැඩීම ගැන ස්තූතිවන්තව, බෝධිසත්වවරයෙකු ලෙස ධර්ම ව්‍යාප්තියේ යෙදෙන්න' යන බුදුන් වහන්සේගේ මහා කරුණාව බව වටහා ගත්තා.

නැවත හැරී බලන විට, මට ධර්මය ඉගෙනීමට මග පෑදුවේ තාත්තාගේ ජීවන රටාවයි. 2005 වර්ෂයේ 10 වන මස 2 වන දින කෝසෙයි පුවත්පතේ පලවූ 'ඉචිජෝ සෙප්පෝ' යන ලිපිය තුල, එම පුවත්පතේ සාකච්ඡාවකට සහභාගී වූ තාත්තා පැවසූ දෙයක් මේ ආකාරයට සඳහන්ව තිබුනා.

''1988 වර්ෂයේ 12 වන මස, මගේ වැඩිමල් පුතාගේ ගකුරින් පාසලේ උපාධි ප්‍රදනෝත්සවයට සහභාගි වුනා. හෝරින්කකු ශාලාවේ පැවැත් වූ එම උත්සවයේදී, නික්යෝ නිවානෝ තුමාව හමුවූ විට, එතුමා 'ඔබගේ පුතාව මම භාර ගන්නම්, ඔහු හදවතින්ම ධර්මය සොයන තරුණයෙක්' යනුවෙන්, ඉදිරියේදී මුලථානයේ රාජකාරි භාරගන්න සිටින පුතා ගැන පවසා සිටියා. එම උත්සවය අවසන්ව නිවසට පැමිණි පසුවද, නික්යෝ නිවානෝ තුමා කියූ දේ ගැන සිතන ගමන්, මමත් ධර්මය ගැඹුරින් ඉගෙනීමට තීරනය කලා. එසේම නිතරම මත්පැන් පානය කරමින් මත් වී පවුලේ අයව කරදරයට පත් කරමින් මා කටයුතු කල ආකාරය පසුවිපරම් කලා. එතැන් සිට මට මත්පැන් පානය නතර කිරීමට හැකිවුනා. වැඩිමහල් පුතා තුළින්, මගේ ගැන පසු විපරම් කර, හොඳ ධර්ම ආකල්ප ඉගෙන ගැනීමට අවස්ථාව ලබාදීම ගැන, සෑම විටම මම නික්යෝ නිවානෝ තුමාට ස්තූතිවන්ත වනවා.''

2012 වර්ෂයේ, වයස අවුරුදු 80 වේදී මරණයට පත් වූ මාගේ පියාව සිහි කරමින් මම නැවත එම පුවත්පතේ ලිපිය කියවා බැලූ විට, මම මුලස්ථානයේ සේවයට බැඳුනු 1988 වර්ෂය, අපගේ පවුලේ ඉරණම වෙනස් කළ කාල පරිච්ඡේදය බව අවබෝධ වුනා.

කෝසෙයි කායි සංවිධානයේ පළමු පුරුකේ සාමාජිකයෙක් වන මාගේ සීයා, යොකොතේ ධර්ම ශාඛාවේ පළමු කාර්යාල ප්‍රධානී ලෙස බැරෑරුම් රාජකාරි කල ඉතා උද්යෝගිමත් පුද්ගලයෙකි. මාගේ අම්මාව දියණියක් ලෙස දරුකමට අච්චී හා සීයා හදාවඩා ගත්තා. වැඩිවියට පත් වීමෙන් පසු තාත්තා සමග විවාහ වුනා. ඔහුද දරුකමට හදාගත් කෙනෙකි. තාත්තා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය අතර විශාල කර්මාන්තයක හවුල් කරුවෙකු ලෙස ජීවත් වුනා. වගකීම් පිලිබඳ දැඩි හැගීමකින් කටයුතු කරන මාගේ පියා, සීයා සමග ගැටුම් ඇතිකරගත් විට බීමත්ව කටයුතු කලා. පාසල් අවධියේ සිටි මට තාත්තාව නිතරම පෙනුනේ, ආයතනයක් කළමණාකරනය කළ නොහැකි කම්මැලි පුද්ගලයෙකු ලෙසයි. කෙසේ නමුත් අනපේක්ෂිත ලෙස මෙම සිදුවීම බුදු දහමේ පිහිට පැතීමට මාව යොමු කළ සාධකය වුනා.

රිෂ්ෂෝ කෝසෙයි කායි ඉගැන්වීම් යනු, මිනිසුන්ව දුකින් මුදවා ගන්නා හා පවුල තුල සාමය ඇති කරන ඉගැන්වීම් ලෙසයි කුඩා කාලයේ මම සිතාගෙන සිටියේ. නමුත් මාගේ ගෙදර නොසන්සුන් බවින් යුත් එදිනෙදා ජීවිතය ගැන සතුටක් නොමැතිව, කෝසෙයි කායි සංවිධානය තුළින් ධර්මය ඉගෙනගත්තත් ඇයි අපට මෙච්චර දුක් පැමිණෙන්නේ, අම්මගේ මේ දුක කවදා ඉවර වේවිදැයි සිතමින් දුක් වුනා. එසේම මේ වාගේ අවස්ථාවක නික්යෝ නිවානෝ තුමා එම දුකින් මිනිසුන්ව මුදවා ගන්නට කුමන ආකාරයට කටයුතු



*දයිසෙයිදෝවේදී සෙප්පෝව ඉදිරිපත් කරන අකගාවා මහතා*

කරනවා ඇතිද යනුවෙන් සිතුනා. එසේම, ‘කෝසෙයි කායි ඉගැන්වීම් ඉගෙන ගත්විට, මාගේ පවුල දුකින් මිදී සාමාන්‍ය තත්වයට පත්වනවා නම්, ඉක්මනට මම එය කරන්න ඕනා’ යන හැඟීම දවසින් දවස වැඩිවුනා.

මේ ආකාරයට පවුලේ සතුට ඇති කිරීමේ කටයුතු පටන් ගත්තා. ඒ සඳහා තෝකියෝවේ තිබූ මූලස්ථානයේ නික්යෝ නිවානෝ තුමාගේ කිට්ටුවටම ගොස් ඉගෙනීම හොඳ යැයි සිතූ මම, අක්කා සහභාගිවන මූලස්ථාන වන්දනා චාරිකාවට සහභාගි වුනා. 1980 වර්ෂයේ සරත් සමයේ රටේ සියළුම තැනින් දයිසෙයිදෝව වන්දනා කිරිමට පැමිණි අයගෙන උතුරා ගිය දයිසෙයිදෝවේ, දැන් මම සිටගෙන සිටින ස්ථානයේ සිට නික්යෝ නිවානෝ තුමා කතා කලා. එම දෙස ඈත සිටම බැලූ පමණින්ම, මාගේ හැඟීම් සහ හදවත සන්සුන් වන බව දැනුනා.

එදින ආපසු පැමිණෙන විට, ආශ්චර්‍යමත් සිදුවීමක් සිදු උනා. එය මුලස්ථාන වන්දනා චාරිකාවට පැමිණි අයට නැවත නිවෙස් බලා යාමට පෙර හෝරින්කකු ශාලාව නැරඹීමට අවස්ථාව උදා වීමයි. විශාල ශාලාවට ඇතුල්වී අවලෝකිතේශ්වර පිළිරුව ඉදිරියේ සිටගත් විට සිතේ භක්තිය වැඩි වී මාගේ මුළු ශරීරයටම අකුණු සැරයක් වැදුනා වාගේ දැනී, එම ස්ථානයේ මාව ගල් වුනා වගේ විය. කවුරුන් හෝ මාගේ හදවතට කෙලින්ම කතා කරනවා වාගේ කටහඩක් ඇසුනා. ‘දැන් ඔබ ටිකක්වත් දුකින් කනස්සල්ලෙන් සිටිය යුතු නැහැ, පවුලේ කටයුතු හොඳින් සිදු වේවි. එම නිසා ඔබ මා වෙත පැමිනෙන්න. මම ඔබව වැදගත්කොට සලකම්’ යන්න ඇසුනු එම හඩ ඉතාම කරුණාවන්ත හඩක් වුනා. ‘මේ මොකක්ද. ඔබ කවුද’ යැයි අසන ගමන්, මගේ හදවත ප්‍රීතියෙන් හා කඳුලින් පිරී ඇති බව මට දැනුනා. සිදුවන්නේ කුමක් දැයි නොදැන, ඔලුව විකාර වී තිබුනත් ඇසුනු හඬේ තිබෙන ශක්තියට යටපත්ව, ‘මට වැටහුනා, මම එය කරන්නම්’, යනුවෙන් මම හදවතින් එයට පිළිතුරු දුන්නා.

මෙය මිනිත්තු කිහිපයක් තුල සිදු වූ දෙයක් වුනත්, මෙම ආශ්චර්යයමත් අත්දැකීම, පසුව මගේ කෝසෙයි කායි ජීවිතයේ තීරණාත්මක සාධකය බවට පත්විය. විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසුව මම උපන් නගරයේ ඇති මහා විද්‍යාලයේ අවුරුදු 2 ක් ගුරුවරයෙකු ලෙස සේවය කිරීමෙන් පසු, ගකුරින් අධ්‍යාපන ලැබීමට තීරණය කලා. ගකුරින් පාසලේ උපාධි ප්‍රධානෝත්සවයේදී ඉහත සඳහන් කළ, ‘ඉචිජෝ සෙප්පෝ’ තිබෙන ආකාරයට මාගේ තාත්තා නික්යෝ නිවානෝ තුමා හමුවුනා. ඉන්පසු මත්පැන් පානය සම්පූර්ණයෙන්ම නවතා දැමීම නිසා, තාත්තාගේ බීමත්කමින් දීර්ඝ කාලයක් දුකට පත්ව තිබූ පවුලට නැවතත් අලෝකමත් කාලයක් උදා වුනා.

පසු කාලීනව මෙම ආශ්චර්‍යමත් අත්දැකීම නික්යෝ නිවානෝ තුමාට පැවසීමට අවස්ථාව උදා විය. නික්යෝ නිවානෝ තුමා සිනාමුසු මුහුණින් ‘එය ශ්‍රාවකයන් ලෙස ලබන ධර්ම පුහුණුවයි, නමුත් එය හැම කෙනෙකුටම ලැබෙන දෙයක් නොවෙයි. හොඳ අත්දැකීමක් ලැබුවානේ’ යැයි කරුණාවන්තව පැවසූවා. නික්යෝ නිවානෝ තුමා පැවසූ ‘ශ්‍රාවකයන් ලබන ධර්ම පුහුණුව’ යනු කුමක්දැයි සිතමින්, එහි තේරුම ගැන නැවත නැවත පසු විපරම් කර බැලුවා. කෝසෙයි කායි සංවිධානය සෑම විටම ‘අන්‍යයන් ප්‍රථමයෙන්’ යන තමාගේ සතුට වගේම, අන්‍යයන්ව දුකින් මුදවා ගන්නා හැඟීමෙන් යුතුව බෝධිසත්ව ක්‍රියාවලියේ යෙදීමයි, නියම දුකින් මිදීමේ හරය ලෙස කියා දෙන්නේ. ඒ නිසා පියාගේ බීමත්කම නිසා පවුලේ තිබූ ප්‍රශ්නයෙන් දුකින් සිටි මට නික්යෝ නිවානෝ තුමා කරුණාව දැක්වූවා. ඒ වාගේම මමත් ‘මගේ දුක නැතිකර ගැනීමට උත්සහ කරන ශ්‍රාවක ධර්මය පුහුණුවේ පමණක් නොයෙදී, අන්‍යයන් ගැන සිතා මෛත්‍රිය හා කරුණාව දක්වන බෝධිසත්ව පුහුණුව තුලයි නියම දුකින් මිදීම’ තිබෙන බව තේරුම් කර දීමට නික්යෝ නිවානෝ තුමාට වුවමනා වු බව, කාලයත් සමඟ වටහා ගැනීමට හැකිවුනා.

නමුත් මම ගකුරින් පාසලට ඇතුලත් වන කාලයේ, ඇත්තටම ගකුරින් පාසලට ඇතුලත් වන හදවතින් සිටිනවාද යන්න මාව අත්හදා බැලීමට මෙන් මෙවන් සිද්ධීන් සමුදායකට මුහුණ දීමට වුනා. ඒ මා සේවය කල පාසල ගින්නක් නිසා විනාශ වීම, තවද මාගේ හිතවත් ඥාති සහෝදරයෙක් නොසිතූ ලෙස මිය යාම හා විශාල නිවාස ණය මුදලක් ගෙවීමේ ප්‍රශ්ණ ඇතිවීම, ආදී ලෙසින් මාගේ හදවත ටිකෙන් ටික කඩා වැටීමට හේතුවන ප්‍රශ්න ඇති වුනා. ඒ සිදුවීම් හැම දෙයක්ම ගකුරින් පාසලට ඇතුළු නොවිය යුතු බවට හඟවන සිදුවීම් යැයි සිතා, ගකුරින් පාසලට ඇතුලත් වීම නවතා දැමීමට කල්පනා කරමින් සිටින විට, මා රැකියාව කරන ස්ථානයට කෙන්ජි හයෂි කියොකයිචෝ සාන්ගෙන් දුරකථන ඇමතුමක් ආවා. මුලස්ථානයේ අයට මාත් සමඟ කතා කිරිමට අවශ්‍ය බවයි එහි සඳහන් වුනේ.

පසු දින මට සඳහන් කල ස්ථානයට ගිය විට, එතන කසුහිරො බබා අධ්‍යකෂක තුමා සහ මසකො ඕතකි අධ්‍යක්ෂක තුමා සිටියා. ඔවුන් දෙදෙනා මට ‘මේ ආකාරයට මනුෂ්‍යයෙකු වී ඉපිද, හමුවීමට අපහසු ධර්මය ඉගෙනීමට හැකිව, නික්යෝ නිවානෝ තුමාගේ අනුගාමිකයෙකු ලෙස කටයුතු කිරීමට ලැබී තිබීමේ වැදගත්කම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ධර්මාචාර්යවරයෙකු පරිච්ඡේදයේ ඉගෙන්වීම් තුළින් පහදා දෙමින්, ඔවුන් මාගේ වියළී ගිය හදවතට විශ්වාසට ඇතුළු කලා.’ මෙවැනි විශිෂ්ට අවස්ථාවක් උදා කර ගැනීමට හැකිවුනේ, මට ගකුරින් අධ්‍යාපන ලබාදීමට කටයුතු කල හයෂි කියොකයිචෝ සාන්ගේ කරුණාවන්තකම නිසාය. කෙසේ හෝ වේවා මගේ නිවස දුකින් මුදවා ගැනීමට කටයුතු කල කියෝකයිචෝ සාන්ට හදවතින්ම ස්තූතිවන්ත වෙමින් ගකුරින් පාසලට ඇතුලත් වුනා.

ගකුරින් අධ්‍යාපනයෙන් පසු, බාහිර සම්බන්දතා අංශයේ වැඩ කරමින්, නික්යෝ නිවානෝ තුමා ප්‍රාර්ථනා කරන සාමයේ මාවත අනුගමනය කිරීමෙන් මම වටිනා අත්දැකීම් ලබා ගත්තා. ඒ වාගේම 2015 වර්ෂයේ 12 වන මස, මෙගුරො ධර්ම ශාඛාවේ කියොකයිචෝ ලෙස වැඩ භාරගත්තා. එතෙක් අවුරුදු 30 කට ආසන්න කාලයක් ආගමික සහයෝගිතාව වෙනුවෙන් කටයුතු කල මට, ධර්ම ව්‍යාප්තියේ ඉදිරිපෙළ කාර්‍යභාරය සිතේ තැතිගැන්වීමත් සමගම ආරම්භ කලා. තෝකියෝ බටහිර ශාඛා ප්‍රධානී කසුඹ චිබා තුමාගෙන් උපදෙස් ලබාගෙන, කියොකයිචෝ ලෙස මෙගුරො ධර්ම ශාඛාවේ පත් වීමේ උත්සවයට සහභාගි වුනා. ශාඛාවට ඇතුලුවන විට ඇතුලත වාඩි වී සිටි සාමාජිකයන්ගේ සිනාමුසු මුහුණු දැකීමෙන් මාගේ හදවතේ තිබුන බය නැතිවී ගියා. මින් ඉදිරියට මේ අය සමග ධර්ම ව්‍යාප්ත කටයුතු ආරම්භ කරනවානෙ යැයි සිතීමෙන් සිතට ශක්තියක් ලැබුනා.

දින කිහිපයකට පසු එක් දිනක උදෑසන, ධර්ම ශාඛාවට ගිය මට, ශාඛාවේ ඉදිරිපස දොර විවර වුනේ නැහැ. ස්වයංක්‍රීයව විවර වන දොරේ ස්විචය ක්‍රියාත්මක කර තිබුනේ නැතිව, දොර විවර නොවුනත්, එම සිදුවීමෙන් මට දෙයක් අවබෝධ කර ගැනීමට හැකි විය. එනම්, උපකාරයක් පැතුවද කිසිකෙනෙකුගෙන් උපකාරයක් නොලැබෙන හා ධර්මය ඉගෙනීම ඉතාම අඩු බැවින් විවිධ දුක් වේදනාවන්ගෙන් පෙළෙන මිනිසුන් මේ ලෝකයේ විශාල වශයෙන් සිටින බවයි. මෙගුරෝ ධර්ම ශාඛාව එවැනි පිඩාවට පත්වූ පුද්ගලයන්ට සහනය ලබා දෙන ස්ථානයක් බවට පත්කල යුතු බවට අරමුණු කලා.

වසර 61 ක් වන මෙගුරො ධර්ම ශාඛාවේ හිටපු යමසකි තකයො පළමු කියොකයිචෝ සාන් ප්‍රමුඛ සියළුම කියොකයිචෝ සාන්ලා වාගේම සාමාජිකයන් සියළුදෙනාගේ කැපවීමෙන් ආශිර්වාදයෙන්, මානව සම්පත් සංවර්ධනය හා ධර්ම ව්‍යාප්ත කටයුතු සිදුකරනවා. එයට අමතරව මෙගුරෝ ප්‍රදේශයේ අනෙකුත් ආගමික නායකයින් සමඟ සහයෝගයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවමින් පැමිණියා.

කියොකයිචෝ ලෙස පත්වී වසරක් 5 ක් ගතවන මේ වසරේ, නව කොරෝනා වෛරස ව්‍යාප්තිය හේතුවෙන් දුක් වේදනාවන්ගෙන් පිරි වසරක් වුනා. මේවර නිච්කෝ නිවානෝ තුමාගේ වාර්ෂික පණිවිඩයේ තිබූ 'තමා සිටින ස්ථානය ධර්මය පුරුදු පුහුණු වන තැනයි යන හැඟීමෙන් දිනපතා ගත කිරීම' හැම දවසකම අභියෝගයක් වුනා. මෙතෙක් කාලයක් 'සාමන්‍ය දේ' යැයි සිතූ දේවල් එසේ නොවේ යැයි පෙනෙන්නට පටන් ගෙන, විශාල මිනිසුන් ප්‍රමාණයක්, ද්‍රව්‍යයන්ගේ උදව්වෙන් උපකාරයෙන් මෙතෙක් ජිවත් වීමට හැකිවීම ගැන ස්තුතිවන්ත විය යුතු බව වටහා ගත්තා. කොරෝනා වලින් පසුව අලුත් ජීවිතයකට අනුවර්තනය වීම සදහා නම්‍යශීලී වීම වැදගත් බව වටහා ගත්තා. මෙගුරො ධර්ම ශාඛාවේ සමාජ මාධ්‍ය භාවිතා කරමින්, හමුවීමට නොහැකි සාමාජිකයන්ට කතා බහ කිරීමට, ධර්මය සාකච්චා කිරීමට අවස්ථාව සලසා ගත්තා. එසේම, සෞඛ්‍ය සේවකයින් වැනි සමාජයට අත්‍යවශ්‍ය වැදගත් සේවාවක් සිදුකරන අයව දිරිගැන්වීමට 'ජීවිතයේ ධජය' නම් කොඩියක් සාද ධර්ම ශාඛාවේ ඉදිරිපිට එල්ලා තැබුවා. කොරෝනා වසංගතය නිසා යන එනමං නොමැති අයගේ දුක්ගැනවිලි වලට සවන්දීමට අංශයක් 'හදවතේ දුරකථන සංවාද' නමින් ජ්‍යෙෂ්ඨ පිරිමි අංශයේ මුලිකත්වයෙන් පිහිටෙවුවා. එසේම නාගරික අපරාධ , ළමා අපචාර වැනි වේදනාකාරී සිදුවීම් වලින් ජීවිත අහිමි වූ අයව අනුස්මරණය කිරිම සිදුකලා. ඒ තුලින් එවැනි සිද්ධීන් වැළැක්වීම සඳහා 'තෙදොරි, මිච්බිකි' සිදුකිරීමේ අභියෝගයද පැහැදිලි විය.

මේ දෙසැම්බර් මාසයේ සිට අන්තර්ජාතික මූලස්ථානයේ ප්‍රධානී ලෙස වැඩ භාරගත්තා. මෙගුරො ශාඛාවේ සියළු දෙනාසමඟ, කොරෝනා අසාදනය වැලැක්වීමට ඇති, ෆයිබර් පුවරුව හරහායි සමුගැනීම සිදු වුනේ. මෙගුරෝ ශාඛාවේ ධර්ම ව්‍යාප්ත කටයුතු වල අත්දැකීම් තුලින් ඉගෙන ගත් දේ ජීවිතයේ වටිනාම වස්තුව ලෙස සලකමින්, අළුතින් ලැබූ තනතුර හොඳින් ඉටුකිරීම, ඔවුනට කරන හොඳම කළගුණ දැක්වීම බව තදින්ම මම විශ්වාස කරනවා. එසේම, මියගිය තාත්තාගෙන් ඉගෙන ගත්, 'නියම සත්‍යාවබෝධය හා දුක් වේදනාවන්ට විසඳුම පවතින්නේ, බෝධිසත්ව චර්යයා පුහුණු තුලයි' යන්න සිතේ තබා ගෙන, ඉදිරියටත් ආධ්‍යාත්මික දියුණුව ඇති කරගැනීමට දිව්රා පොරොන්දු වෙමින්, අද දින මාගේ සෙප්පෝව අවසන් කරනවා.

සියළු දෙනාටම බොහොම ස්තුතියි.



*මොන්ගෝලියා ශාඛාවේ චාරිකාවක නිරත වූ අකගාවා මහතා (මෙගුරෝ ශාඛාවේ ප්‍රධානීව සිටින අවධියේ)*

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ
## සාරාංශය හා වැදගත් කරුණු

කර්තෘ: නික්යෝ නිවානෝ

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 22 වන පරිච්ඡේදය, පවරා දීම



### පවරා දීමේ ප්‍රීතිය හා දුෂ්කර කාර්යය තුලින් ලැබෙන සතුට

මෙම පරිච්ඡේදයේදී ශාක්‍යමුණි බුදුන් වහන්සේ විසින් සියළුම බෝධිසත්වයන් වහන්සේලාගෙ හිස පිරිමදිමින්, 'අනුත්තර සම්‍යක් සම්බෝධිය ලබගත හැකි විශිෂ්ට වූ ධර්මය, ප්‍රචාරය කිරීමේ බැරෑරුම් වගකීම ඔබ සියළුදෙනාට පවරමි. එකඟ කරගත් සිතින් යුතුව, සියළුදෙනාගේ යහපත පිණිස එය සිදු කරන්න' සේ භාරදෙයි. එම නිසයි පවරා දීම යනුවෙන් මෙම පරිච්ඡේදය නම් කරන්නේ.

එම කරුණ ඇසූ බෝධිසත්වයන් වහන්සේලා මින් මතු නොවූ ආකාරයේ ප්‍රීතියක් ලැබූහ. එසේම, එම දුෂ්කර කාර්යය කිරිම තුලින් ලැබෙන සතුටද දැනි දැඩිව ධර්ම ප්‍රචාරය කිරිමට අධිෂ්ටාන කලහ. වර්තමාන බෝධිසත්වයන් වන අපද, 'පවරා දීමේ ප්‍රීතිය' හා 'දුෂ්කර කාර්යය තුලින් ලැබෙන සතුට' ද හදවතට බද්ධ කරගත යුතුය. එය මේ පරිච්ඡේදයේ ඇති වැදගත්ම කරුණ වේ.

### නැවතත් ගිජ්ජුකූට පර්වතය වෙතට

මෙම පරිච්ඡේදයෙන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ විශාල පියවරක් සම්පූර්ණ කරයි. එනම්, තථාගතයන් වහන්සේගේ සදාතන ජීවිතය හා එය විශ්වාස කිරීමෙන් ලැබෙන ආනිශංස ගැන කොටස වේ. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය යන නාට්‍යයේ 'පරමාදර්ශී ස්වරූපය වන අහස් ගර්භයේ තිරය වැසී, නැවතත් යථාර්තවාදී ස්වරූපය වන ගිජ්ජු කූට පර්වත්වයට' පැමිණේ.



# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
# 23 වන පරිච්ඡේදය, භෛෂ ජ්‍යරාජ බෝධිසත්වයන්ගේ පෙර භවය



## බෝධිසත්වයන් වහන්සේලා සියළු සත්වයන්ගේ ආදර්ශය වේ

මේ දක්වා දේශනා වලදී 'සත්‍යය වූ ධර්මය' ගැන හොඳින් අවබෝධ විය. මෙතැන් සිට 'ධර්ම පුහුණුව' සිදු කල යුතුය. නමුත් මෙම ආර්ය වූ ධර්මය එදිනෙද ජීවිතයට බද්ධ කරගත යුතු ආකාරය සාමාන්‍ය වැසියන්ට සොයා ගැනීමට නොහැකි විය. එම ප්‍රශ්නය විසඳීම සඳහා පරම සතුට වන බුදු බවට පියවරක් පසුපසින් සිටින, නමුත් විශිෂ්ට වූ ආනිශංස වලින් යුතු හා විශිෂ්ට ක්‍රියාවන්ගේ නියෝජිතයන් වන බෝධිසත්වයන් අනුකරණය කිරීම ප්‍රධානම මාර්ගය වේ.

එම නිසා මින් ඉදිරියට තිබෙන දේශනා වල ප්‍රධාන වශයෙන් ඒ ගැන සඳහන් වේ. සියළු සත්වයන්ට එසේ සමීප ආදර්ශයන් පෙන්වීම තුලින් ප්‍රබෝධයක් ලබාදෙයි.

## තම ශරීර පරිත්‍යාගයෙන් කරන පුහුණුව විශිෂ්ටම පුද පූජාවයි

එම පරිච්ඡේදයේ සඳහන් වන, භෛෂ ජ්‍යරාජ බෝධිසත්වයන් වහන්සේ, මනුෂ්‍යයන්ගේ අසනීප සුව කිරීමේ ප්‍රාර්ථනයෙන් කටයුතු කල බෝධිසත්වයන් වහන්සේ කෙනෙකි. මෙහිදි පෙර භවයේ ආත්ම පරිත්‍යාගයන් තුලින් බුදුන් වහන්සේට පුද පූජා කිරීම ගැන සඳහන් වේ.

භෛෂ ජ්‍යරාජ බෝධිසත්වයන් වහන්සේගේ පෙර භවයේ, සර්ව සප්ත ප්‍රියදර්ශන බෝධිසත්වයන් ලෙසින් චන්ද්‍ර සූර්ය්‍ය විමල ප්‍රභාශ්‍රී නම් බුදුන් වහන්සේගෙන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ශ්‍රවණය කර, ඉතා දීර්ඝ කාලයන් ධර්මයන් ප්‍රගුණ කිරීමෙන් විශිෂ්ට වූ සමාධියක් අත්කර ගත්හ. ඉන් පසු චන්ද්‍ර සූර්ය්‍ය විමල ප්‍රභාශ්‍රී නම් බුදුන් වහන්සේට හා සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට කෘතවේදීත්වයේ පුද පූජා පැවැත්විය යුතුයි යැයි සිතා, සෘද්ධි බලයෙන් අහසින් මල් වැසි පතිත කලහ. නමුත්, එවැනි දේ වලට වඩා තම ශරීරය කැප කරමින් කරන පූජාවයි වැදගත් වන්නේ ලෙසින් සිතා, නොයෙකුත් සුවඳ සඳුන් පානය කර, සුවඳ තෙල් ගල්වා ශරීරයට ගිනි තබා ගත්තා. එම ගිනි දැල් අවුරුදු 1200 ක් දැල්වෙමින්, මුළු ලෝකයම ආලෝකමත් වුනා.

එයින් සර්ව සප්ත ප්‍රියදර්ශන බෝධිසත්වයන්ගේ ජීවිතය අවසාන වුවත්, නැවතත් චන්ද්‍ර සූර්ය්‍ය විමල ප්‍රභාශ්‍රී බුදුන් වහන්සේගේ ලෝක ධාතුවේ විමලදත්ත ගෘහයේ ඉපැද, බුදුන් වහන්සේව වන්දනා කිරීමට පැමිණියා. නමුත්, බුදුන් වහන්සේ විසින් 'මගේ නිර්වාණ කාලය පැමිණ ඇත. ධර්මය බෙදා හැරීමේ වගකීම ඔබට භාර කරමි' සේ පවසමින් පරිණිර්වාණයට පත්වූහ.

සර්ව සප්ත ප්‍රියදර්ශන බෝධිසත්වයන් ඉතා වේදනාවෙන්, බුදුන් වහන්සේගේ දේහය ආදාහනය කරමින්, එම ශාරීරික ධාතූන් එකතු කර රත්නමය ස්තූප 84000 ක් ඉදි කලහ. එයද ප්‍රමාණවත් නොවේ යැයි සිතමින්, තම බාහුව ගිනි දල්වා ගත්තේය. එය දැකීමෙන් විශාල පිරිසකට සම්‍යයක් සම්බෝධිය ලබා ගැනීමට සිත්විය. අවුරුදු 72000 ක් දැල්වුනු ගින්නෙන් බෝධිසත්වයන් වහන්සේගේ බාහුව නැති විය. එයින් විශාල පිරිසක් දුකට පත්වූහ.

එය දුටු බෝධිසත්වයන් වහන්සේ, 'මාගේ බාහුව නොමැති වුවත්, ඒ වෙනුවට සදතනික වූ ශරිරයක් ලැබුනා යැයි විශ්වාස කරමි' ලෙසින් පැවසූහ. එසැණින් එම බාහුව නැවත ප්‍රකෘති තත්වයට පත්විය.

මෙම කතාවෙන් කියාදෙන වැදගත් කරුණු වන්නේ,
1. ආත්ම පරිත්‍යාගයට එහා ගිය විශිෂ්ට දෙයක් මනුෂ්‍යයන්ට නොමැත.
2. ධර්මය වෙනුවෙන් කළ හැකි උපරිම පුද පූජාව ධර්ම පුහුණුව වන බවයි.

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට ප්‍රශංසා කරන දස උපමා හා ධර්ම ව්‍යාප්තිය



මෙම සර්ව සත්ත ප්‍රියදර්ශන බෝධිසත්වයන් වහන්සේගේ කතාවෙන් පසුව, බුදුන් වහන්සේ විසින් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ විශිෂ්ටත්වය දස උපමා මගින් හා සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ප්‍රායෝගිකව පුරුදු පුහුණු වීමෙන් ලැබෙන ආනිශංස ගැන දේශනා කලහ.

මේ ආකාරයට අපගේ හදවත් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට විවර කළ බුදුන් වහන්සේ, ඉන්පසු 'මාගේ පරිනිර්වාණයෙන් පසුව අවසන් වසර පන් සියය තුළ ඔබ විසින් එය පුලුල් ලෙස මෙම ජම්බුද්වීපය තුළ ප්‍රචාරණය කළ යුත්තේ ය. එය විනාශ වන්නට ඉඩ නො දිය යුතු ය. මාරයාට හෝ මාර සෙනගට හෝ දිව්‍ය නාග රාක්ෂ කුම්භාණ්ඩ වැනි කිසිවෙකුට අත ගසන්නට ඉඩ නො දිය යුතු ය.' යනුවෙන් ධර්මය ක්ෂය වන කාලයේදීයි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කර ප්‍රචලිත කල යුත්තේ ලෙසින් දැඩිව ප්‍රකාශ කලහ.

ධර්මය ක්ෂය වන කාලය යනු, වර්තමාන කාලයයි. එම ධර්මය ක්ෂය වන කාලයේ ජීවත්වන අපිට විශිෂ්ට වූ කියාදීම ඇතුලත් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ප්‍රචලිත කිරීමේ භාරදූර වගකීම පැවරී ඇත. එනම් බුදුන් වහන්සේ විසින් සෘජුවම එම වගකීම අපහට භාරදී ඇති බවයි.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』
ග්‍රන්ථය ඇසුරෙනි

කෝසෙයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P198-P203







# Director’s Column

## සෑම දෙයක්ම බුදුන් වහන්සේගෙන් ලැබෙන පණිවුඩයකි

අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී
කෙයිචි අකගාවා මහතා

සෘද්ධි බලය යන වචනයේ දෝංකාරය අපිව නොයෙකුත් ලෝකයන්ට රැගෙන යයි. නමුත්, නොයෙකුත් තොරතුරු ගලාගෙන යන ඩිජිටල් සමාජයේ, බොහෝ විකල්ප තුලින් තෝරා ගැනීම් කිරීමට අපහසුව දවස ගෙවන වර්තමානයේ අපිට, එවැනි ගුප්ත දේ වල සංවේදීතාව ලබා ගැනීම දුෂ්කර බව සිතෙනවා.

සුත්‍ර පොතෙහි ‘සෑම දෙයක්ම බුදුන් වහන්සේගෙන් ලැබෙන පණිවුඩයකි’ යන වදනෙහි, මේ ලෝකයේ ‘සෑම දෙයක්ම ජීවත්කරමු’ යන ප්‍රාර්ථනය ගැබ්වී තිබෙන බුදුන් වහන්සේගේ මෛත්‍රිය හා කරුණාව ගැන කියාදෙයි. එම පණිවුඩය ලබා ගන්නා ග්‍රහකය වන්නේ අපගේ හදවතයි.

සෘද්ධි බලය ‘දෙවියන් හා බුදුන් වහන්සේ විසින් සියළු සත්වයන්ට ආදරය කරන්නා වු හදවතයි’ සේ ගත්කල, එය පරාර්ථකාමීත්වයේ හදවත තුලින් උපදින ශක්තියයි. එමනිසා ආත්මාර්තකාමීත්වය තුරන් කර මිනිසුන් සමග කටයුතු කරන විට, නොමැනිය හැකි තරම් ආරක්ෂාවක් ලැබෙයි.

නිචිකෝ නිවානෝ තුමා මේ මස ධර්ම පණිවුඩය තුල සදහන් කර ඇති පරිදි ‘මුළු ශරීරයෙන්ම ධර්මය දේශනා කරන පුද්ගලයෙක්’ බවට පත්ව, සැමට සාමයෙන් ජීවත්විය හැකි සමානාත්මතාවයෙන් පිරි ලොවක් බිහි කිරීමට කටයුතු කරමු.



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
POBox 33636, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, USA
POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: info@rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809 Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: dharmasa@rksabuddhistcenter.org
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP, CEP 08730-000, Brasil

**在家佛教韓国立正佼成会**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571 FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571 FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633 FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478 FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218 Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406 FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhiln**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960 Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949 Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247 Email: info@rkuk.org URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230 FAX: 03-5341-1224 URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**